F048

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## අධිකරණ අමාත්‍යාංශයේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර ලේකම් (නීති) තනතුරට බඳවා ගැනීම - 2020

අධිකරණ අමාත්‍යාංශයේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර ලේකම් (නීති) තනතුරෙහි පවතින පුරප්පාඩු 01 සඳහා සුදුස්සන් තෝරා ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි 2019/09/12 දිනැතිව පළ කරන ලද අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ (අ) හා 05 වගන්ති පහත පරිදි සංශෝධනය කෙරේ.

**(අ). අයදුම්පත් කැඳවන අවසාන දිනය 2020/10/11 දින වේ.**

**05. වයස් සීමාව**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.).

සැ.යු. :

- 2019/09/12 දිනැති පුවත්පත් නිවේදනය අනුව අයදුම්පත් යොමු කළ අයදුම්කරුවන් නැවත අයදුම්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

මේ පිළිබඳ වැඩිදුර විස්තර සඳහා 011 – 2452175 දුරකථන අංකයෙන් සහකාර ලේකම් (පාලන) ඇමතීම මඟින් හා අධිකරණ අමාත්‍යාංශ වෙබ් අඩවිය (www.moj.gov.lk) මඟින් ලබා ගත හැක.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

..............................................

ලේකම්

අධිකරණ අමාත්‍යාංශය

2020/08/24.......

(16)

F049

# රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර ලේකම් (නීති) තනතුරට බඳවා ගැනීම - 2019

අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර ලේකම් (නීති) තනතුරෙහි පවතින පුරප්පාඩු 01 සඳහා සුදුස්සන් තෝරා ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි සුදුසුකම් සපුරන ශ්‍රී ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර **ලේකම්, අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, උපරිමාධිකරණ සංකීර්ණය, කොළඹ 12** යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස උඩ කෙළවරේ **"විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර ලේකම් (නීති) තනතුර සඳහා බඳවා ගැනීම"** යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2019/10/12 දින වේ.

සටහන : ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

**01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් ලබා දෙන ලකුණු මත තෝරා ගනු ලබයි.
පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

**02. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

I. මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ. තව ද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය. (2016 වර්ෂයට පෙර රාජ්‍ය සේවායේ පත්වීම් ලද රජයේ නිලධාරීන් සම්බන්ධව මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය අදාළ නොවේ)

II. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත්වන අතර එම වසර තුන (03) ඇතුලත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව අනෙක් භාෂාව පිළිබඳ ප්‍රවීනතා මට්ටම වසර 05ක් තුළ දී ලබා ගත යුතුය. රාජ්‍ය භාෂාවකින් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් වසර 03ක් තුළ දී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳව ප්‍රවීනතාවය ලබාගත යුතු අතර අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතාවය වසර පහක් (05) ඇතුලත ලබා ගත යුතුය. I කාණ්ඩයට අයත් දෙවන රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතා මට්ටම ලබා ගත යුතුය.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසි වලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත්වේ.

**03. වැටුප් පරිමාණය:**

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL – 1-2016 , 47,615-10 x 1,335- 8 x 1,630- 17 x 2,170- 110,895/-ක (මාසික ) වැටුප් පරිමාණයක් හිමි වේ. (ඔබට වැටුප් ගෙවනු ලබන්නේ 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධාන අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.)

**04. සුදුසුකම්:**

I. **අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්:**
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් නීතිවේදී උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වීම.

II. **පළපුරුද්ද:**
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර 03කට නොඅඩු සක්‍රිය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

**05. වයස් සීමාව:**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය.(දැනටමත් රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

**06. කායික සුදුසුකම් :**

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**07. වෙනත් සුදුසුකම්:**

I. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

II. මනා ලෙස ඉංග්‍රීසි භාෂාව හැසිරවීමට හැකි විය යුතුය.

III. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

IV. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**08.** **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය:**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ලකුණු ලබා දීම සිදු කරනු ලැබේ.

**09.** **සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීමේ ක්‍රමය:**

| | විෂය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01. | **අතිරේක අධ්‍යාපන සුදුසුකම්**<br>I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන නොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලබන නීතිය පිළිබඳ උපාධියෙහි<br>- පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා<br>- දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා<br>- දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා<br>II. ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසන් වසර විභාගය පළමු පෙළ සාමාර්ථයක් සඳහා<br>III. ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසන් වසර විභාගය දෙවන පෙළ සාමාර්ථයක් සඳහා<br>(ලකුණු ලබා දෙනු ලබන්නේ උපාධිය හෝ නීති විද්‍යාලයේ අවසන් වසරේ පරීක්ෂණය යන දෙකෙන් ලබා ඇති ඉහලම සුදුසුකමට පමණි) | 20<br>15<br>10<br>15<br>10 | 20 |
| 02. | **අතිරේක වෘත්තීය සුදුසුකම්**<br>I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලය මගින් පිරිනමනු ලබන පශ්චාත් නීතිවේදී උපාධිය (LLM)<br>II. පාඨමාලාවේ කාල සීමාව එක් වසරකට නොඅඩුවූ නීති ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව<br>III. පාඨමාලාවේ කාලසීමාව මාස 06කට නොඅඩුවූ පශ්චාත් නීති ඩිප්ලෝමාව | 15<br>08<br>05 | 15 |

| | | | |
|---|---|---|---|
| 03. | **පළපුරුද්ද**<br>I. රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ නීතිඥවරයෙකු ලෙස ලබා ඇති පළපුරුද්ද<br>(අයදුම්පත කැඳවීමේ නිවේදනයේ සඳහන් මූලික සුදුසුකම වන අවුරුදු 03 ක සේවා පළපුරුද්දට අමතරව නීතිඥයෙකු ලෙස ලබා ඇති පළපුරුද්ද මෙහිදී සලකා බලනු ලැබේ.)<br>එක් වසරකට ලකුණු 05 බැගින් උපරිම ලකුණු 30කි<br>(විනිසුරුවරයෙකුගෙන් හෝ ජනාධිපති නීතිඥවරයෙකු හෝ අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයෙකුගෙන් හෝ ලබාගත් සහතිකයක් මගින් පළපුරුද්ද සනාථ කළ යුතුය.) | වසරකට ලකුණු 05 බැගින් | 30 |
| 04. | **පරිගණක හැකියාව**<br>I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත ආයතනයකින් ලබා ගත් තොරතුරු තාක්ෂණ විෂය ප්‍රධාන විෂයක් ලෙස ඇතුළත් වූ උපාධිය<br>II. මාස 06 කට නොඅඩු පාඨමාලා කාලයක් සහිත රජයේ පිළිගත් ආයතනයකින් ලබා ගත් තොරතුරු තාක්ෂණ පිළිබඳ ඩිප්ලෝමාව<br>III. මාස 03කට නොඅඩු පාඨමාලා කාලයක් සහිත රජය පිළිගත් ආයතනයකින් ලබා ගත් තොරුතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 15<br>10<br>05 | 15 |
| 05. | **ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව**<br>I. උපාධිය, පශ්චාත් උපාධිය, නීතිවේදී පාඨමාලාව, පශ්චාත් නීති පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා තිබීම.(අදාළ විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතුය)<br>II. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජයේ පිළිගත් ආයතනයකින් ලබාගත් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමාව (පාඨමාලාවේ කාලසීමාව මාස 06කට නොඅඩු )<br>III. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජයේ පිළිගත් ආයතනයකින් ලබා ගත් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (පාඨමාලාවේ කාලසීමාව මාස 03කට නොඅඩු ) | 15<br>10<br>05 | 15 |
| 06. | **සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව** | 05 | 05 |

**10.**

I. ඉල්ලුම් පත්‍රය සෙ.මී. 22 – 29 ප්‍රමාණයේ A4 කඩදාසි වල සකස් කළ යුතු අතර, 1 - 14 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද, 15 වන ශීර්ෂ දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළයුතු බවත් ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති, නියමිත දිනට පසුව ලැබෙන හා ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර දැනුම දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත් වැඩි දුරටත් දන්වමි. ඉල්ලුම් පත්‍ර මේ සමඟ ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුව සකසන්න. ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ.

**සැලකිය යුතුය:**

අ. අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.

ආ. ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

II. රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතුය.

**11.** රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍ර ලේඛ හා අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියට අදාළ වූ සේවා ව්‍යවස්ථා හා ඊට සිදුකර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

..............................................................

ලේකම්

අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

2019/ 9 / 06